# කොළඹ විශ්ව විද්‍යාලය

## ශාස්ත්‍ර පීඨය

## ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය- පළමු සෙමෙස්තරය 2017/2018

## PSC 2118-දේශපාලන චින්තනයේ ප්‍රධාන ප්‍රවාහ

## කාලය පැ 02 යි

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න

සෑම පිළිතුරකට ම උපරිම ව ලකුණු පහළොවක් (15) ලැබේ

---

(1) ප්ලේටෝට අනුව යුක්තිය මුදුන්පත් කරගත හැක්කේ පුද්ගල ආත්මය, රාජ්‍යයේ ආත්මය සහ කෘත්‍ය විශේෂීකරණය අතර සුසංයෝගී තුලනයකිනි. මේ ප්‍රකාශය පැහැදිලි කරන්න

(2) (අ) හොඳ ප්‍රායෝගික රාජ්‍යයක් පිළිබඳ ඇරිස්ටෝටලියානු සංකල්පය පැහැදිලි කරන්න

(ආ) පරමාදර්ශී රාජ්‍යයක ලක්ෂණ ගැන ඔහු කී අදහස් සැකෙවින් දක්වන්න.

(3) රෝම සමූහාණ්ඩු ක්‍රමයේ ආයතනික පිළිවෙළ ගැන පොලිබියස් දැක්වූ අදහස් විභාග කරන්න.

(4) රාජ්‍යයේ බිහිවීම ගැන සෙනෙකා දැක්වූ අදහස්වල ආගමික ගති ලක්ෂණ තිබේ ද? පැහැදිලි කරන්න.

(5) *දෙවියන් ගේ නගරය* කෘතිය තුළ සාන්ත ඔගස්තීනු ඉදිරිපත් කළ මූලික දේශපාලන සංකල්ප මොනවාදැයි පැහැදිලි කරන්න.

(6) මැකියාවෙල්ලි ගේ කාලයේ ඉතාලියේ පැවැති සමාජ දේශපාලන පසුබිම අවධානයට ගනිමින් මැකියවෙල්ලි සිය *කුමාරයා* කෘතියෙහි ඉදිරිපත් කළ දේශපාලන අදහස්වල වැදගත්කම හඳුන්වන්න.

(7) රාජ්‍යයේ බිහිවීම, දේශපාලන බලය සහ නීතිය යන තේමා සම්බන්ධයෙන් සාන්ත තෝමස් ඇක්වයිනාස් ගේ අදහස් පැහැදිලි කරන්න.

(8) පහත සඳහන් ඕනෑ ම දේශපාලන චින්තකයන් දෙදෙනකු ගැන සටහන් ලියන්න.

(අ) මාකස් ටියුලියස් සිසෙරෝ　　(ආ) තෝමස් හොබ්ස්

(ඇ) ජෝන් ලොක්　　(ඈ) ජීන් ජැක්වේ රූසෝ